ලුනාව පරිසර පවර්ධන හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය -2012

------------------------------------------------------------------

1. මතය

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව මෙම වාර්තාවේ 3 ජේදයේ දැක්වෙන කරුණුවලින් උද්ගත වන ගැලපීම්වලින් ඇති වන බලපෑම් හැරුණු විට, මාගේ මතය වනුයේ,

(අ) 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ව්‍යාපෘතිය නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බව හා 2012 දෙසැම්බර් 31 දිනට ව්‍යාපෘතියේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව.

(ආ) සපයන ලද අරමුදල් ඒවා සපයනු ලැබූ කාර්යයන් සඳහා උපයෝජනය කර තිබුණු බව.

(ඇ) මාගේ පෙර වර්ෂයේ විගණන වාර්තාවෙන් පෙන්වා දෙන ලද කරුණු නිවැරදි කර ගැනීම සඳහා කළමනාකරණය විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන තිබුණු බවත්ය.

2. මූල්‍ය ප්‍රකාශන

----------------

2.1 මූල්‍ය කාර්ය සාධනය

------------------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන සහ විගණනය සඳහා ලබාගත හැකිවූ තොරතුරු අනුව, සමාලෝචිත වර්ෂය සඳහා ව්‍යාපෘති වියදම රු. 248,250,880 ක් වන අතර 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම රු.9,358,948,517 ක් විය. සමාලෝචිත වර්ෂය සඳහා වියදම, ඉකුත් වර්ෂයේ වියදම සහ 2012 දෙසැම්බර් 31 දිනට සමුච්චිත වියදම සාරාංශ කර පහත දැක්වේ.

| විෂයය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වියදම | | 2012 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණ වියදම |
|---|---|---|---|
| ------ | --------------------------------------- | | -------------- |
| | 2012 | 2011 | |
| | රු. | රු. | රු. |
| ස්ථාවර වත්කම් සංවර්ධන වියදම් | - | 99,860 | 536,247,954 |
| ------------------- | | | |
| ප්‍රධාන සිවිල් වැඩ | - | 8,136,627 | 5,809,166,321 |
| නැවත පදිංචි කිරීම | 61,017,374 | 100,433,874 | 796,452,052 |
| ප්‍රජා වැඩිදියුණු කිරීම | - | 14,339 | 249,793,262 |
| ධාරිතා වර්ධනය | - | - | 45,910,215 |
| උපදේශක සේවා | - | - | 925,704,658 |
| ඉඩම් අත්පත්කර ගැනීම | 53,437,936 | 41,976,423 | 444,873,554 |
| ව්‍යාපෘති කළමනාකරණ වියදම | 133,795,570 | 151,826,821 | 453,401,380 |
| ණය මත පොලිය | - | - | 165,760,114 |
| වියදමින් අඩුකිරීම් | | | |
| -------------------- | | | |
| විදේශ විනිමය හුවමාරු ලාභය | - | - | (55,978,478) |
| විවිධ ආදායම් | - | - | (64,258) |
| කලින් ගෙව තැන්පතු ආපසු ලැබීම | - | - | (12,318,257) |
| | ------------------- | -------------------- | --------------------- |
| | 248,250,880 | 302,487,944 | 9,358,948,517 |
| | ============ | ============ | ============ |

## 3. විගණන නිරීක්ෂණ

---------------------

### 3.1 නීති , රීති ආදියට අනුකූල නොවීම

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ඇළ රක්ෂිතය නිශ්චයකොට ප්‍රකාශයට පත් කිරීමේ අංක 1662/17 හා 2010 ජුලි 14 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට් පත්‍රයේ සඳහන් කරුණු වලට පටහැනිව ඇළ රක්ෂිත සීමාවන් ඇතුළත අනවසර ඉදිකිරීම් සිදුකර ඇති බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය විය.

(ආ) ඉහත (අ) හි සඳහන් පරිදි අතිවිශේෂ ගැසට් පත්‍රයේ කොන්දේසි හා නියමයන් හි "සී " වගන්තියට අනුව මෙම ප්‍රකාශිත ඇළ රක්ෂිත තුළ ඇති යම් ඇළකට සංස්ථාවේ අනුමැතියකින් තොරව වැසි ජල කානු සම්බනධ නොකළ යුතු අතර මලාපවහන නල , කර්මාන්ත අපද්‍රව්‍ය හෝ කිසිදු දූෂක කාරකයක් දැමීම හෝ බැහැර කිරීම නොකළ යුතුය." යන කරුණු වලට පටහැනිව දෙහිවල ගල්කිස්ස මහනගර සභා බල ප්‍රදේශයේ හා මොරටුව මහනගර සභා බල ප්‍රදේශයේ රාජ්‍ය හා පෞද්ගලික ආයතන 07 ක් සහ රතුකුරුස හා අරලිය නිවාස සංකීර්ණයේ නිවාස 800 ක පමණ පිරිපහදුවකින් තොරව මල අපද්‍රව්‍ය සහ රසායනික අපද්‍රව්‍ය බැහැර කිරීම් සිදුකරනු ලබන බව විගණන ක්ෂේත්‍ර පරීක්ෂාවේදී නිරීක්ෂණය වීය.

### 3.2 ආර්ථික නොවූ ගනුදෙනු

--------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අත්පත් කරගත් ඉඩම් වෙනුවෙන් වන්දි ගෙවීමේදී, අදාල නියෝගය ගැසට් පත්‍රයේ පලවූ දින සට වන්දි මුදල් ගෙවන දිනය තෙක් වන්දි මුදල් මත සියයට 7 ක වාර්ෂික පොලියක් ගෙවිය යුතුය. වන්දි ගෙවීම් ප්‍රමාදයන් හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී රත්මලාන හා මොරටුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල විසින් පිළිවෙලින් රු.57,361 ක් හා රු.696,535 ක් පොලී වශයෙන් ගෙවා තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) නියමිත දිනයේදී කොන්ත්‍රාත්තුවේ වැඩ ආරම්භ කිරීම සඳහා කොන්ත්‍රාත්කරුවන්ට ඉඩම් භාරදීමට නොහැකි වීමෙන් කොන්ත්‍රාත්කරුවන්ගේ උපකරණ ඉවත්කර ගැනීම, නැවත යොදවා ගැනීම සහ නිෂ්ක්‍රීයව පැවතීම හේතුවෙන් සහ බිල්පත් ගෙවීම ප්‍රමාදවීම හේතුවෙන් 2012 වර්ෂය අවසානය දක්වා රු.483,235,236 ක මුදලක් ප්‍රමාද ගාස්තු ලෙස ගෙවා ඇති අතර එම ප්‍රමාණය මුළු විදේශ ණය මුදලින් සියයට 7 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) මෙම ලුනාව ව්‍යාපෘතිය ජල සම්පාදන හා ජලාපවහන අමාත්‍යාංශයේ විෂය පථය යටතට පැමිණියද ලුනාව ව්‍යාපෘතිය මගින් රු.40,604,364 ක් වැය කර මාර්ග පුනරුත්ථාපනය කර තිබූ දිග මීටර් 4,832 ක මාර්ග, අප ජලය ඉවත් කිරීමේ ව්‍යාපෘතිය මගින් අප ජල නල එළීම නිසා සම්පූර්ණයෙන්ම හානි වී තිබුණි.

## 3.3 කාර්ය සාධනය

-----------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය මගින් ඉඩම් කොටස් 2,373 ක් අත්පත් කරගෙන තිබුණද එයින් ඇතැම් ඉඩම් රජයට අයත් ඉඩම් වුයෙන් වන්දි ලබාගැනීමට සුදුසුකම් ලබා තිබුණේ ඉඩම් කොටස් 1,438 ක් පමණ. කෙසේ වෙතත් 2012 දෙසැම්බර් 31 දින වන විටද ඉඩම් කොටස් 252 ක් වන්දි ගෙවීමට හෝ නැවත පැවරීමට ඉතිරි වී ඇති බව නිරීක්ෂණය විය.

(ආ) ව්‍යාපෘතිය විසින් මිලදීගත් වාහන හා යන්ත්‍රෝපකරණ ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසුව, මෙහෙයුම් හා නඩත්තු කටයුතු සඳහා පහත විස්තර දැක්වෙන ආයතන වෙත ලබාදී තිබුණද එම ආයතන මගින් අපේක්ෂිත ප්‍රතිඵල ලබාගත හැකි වන පරිදි නඩත්තු කටයුතු ඉටුකරවා ගැනීම සහතික කර ගැනීමට අමාත්‍යාංශය හෝ අදාළ අධිකාරීන් විසින් යාන්ත්‍රණයක් ස්ථාපිත කර නොතිබුණි.

| ආයතනය | වාහන / යන්ත්‍රෝපකරණ වල වටිනාකම රු. |
|---|---|
| දෙහිවල, ගල්කිස්ස මහ නගර සභාව | 62,924,977 |
| මොරටුව මහ නගර සභාව | 170,855,945 |
| ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව | 216,395,250 |
| එකතුව (එකතු කළ අගය මත බදු රහිත) | 450,176,172 |

## 3.4 පර්බාහිර විෂයයන්

-------------------

දෙහිවල, ගල්කිස්ස මහ නගර සභාව සහ මොරටුව මහ නගර සභාව වෙත පිළිවෙලින් රු.4,813,500ක් වටිනා ඩබල් කැබ් රථයක් හා රු.9,627,000 ක් වටිනා ඩබල් කැබ් රථ දෙකක් ලබා දී තිබූ අතර එම වාහන ව්‍යාපෘතියේ අරමුණු වලට පටහැනිව නගරාධිපතිවරුන්ගේ භාවිතය සඳහා යොදාගෙන තිබුණි.

## 3.5 කළමනාකරණ අකාර්යක්ෂමතා

-----------------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව මගින් නඩත්තු කිරීමට නියමිත තණ පිඩලි ඇල්ලූ පස් ඉවුරු සහිතව ඉදිකරන ලද සහ ගේබියන් බැමි යොදා ඉවුරු ඉදිකරන ලද ප්‍රධාන ඇළ මාර්ග නිසි පරිදි නඩත්තු කර නොතබුණි. ඒ හේතුවෙන් එම ඇළමාර්ග අවහිර වී ජලය බැස නොයන තතත් වයක් පවතින බව නිරීක්ෂණය විය.

(ආ) ලේක්වීව් ළමා උද්‍යානය ඉදිකිරීම සඳහා රු.2,340,955 ක් වැයකර තිබූ අතර ඇතැම් උපකරණ නඩත්තු නොකිරීම හේතුවෙන් ඒවා භාවිතයට ගත නොහැකි තත්ත්වයකට පත්ව තිබුණු බව 2013 පෙබරවාරි මාසයේදී සිදුකල පරීක්ෂාවකදී අනාවරණය විය.

(ඇ) 2013 පෙබරවාරි මස කරනු ලැබූ පරීක්ෂාවට අනුව අත්‍යවශ්‍ය මෙහෙයුම් හා නඩත්තු කටයුතු නිසිපරිදි සිදු නොවන බවත් අදාළ මහ නගර සභා බලප්‍රදේශවල ඇතැම් ඇළ මාර්ගවල කසල,විවිධ අපද්‍රව්‍ය හා අප ජලය රැඳී තිබෙන බවත් නිරීක්ෂණය විය.

(ඈ) ව්‍යාපෘතිය අවසන් වීමෙන් පසු එහි සම්බන්ධීකරණ මෙහෙයුම් හා නඩත්තු කටයුතු වෙනුවෙන් විශේෂ ඒකකයක් ස්ථාපිත කිරීමට, රු.17,531,310 ක් වටිනා වාහන හා අනෙකුත් භෞතික සම්පත් සහ මොරටුව, ලුනාවෙහි, 8 වන පටුමගෙහි, ගොඩනැගිල්ලක් සහිත පර්චස් 80 ක ඉඩමක රඳවාගෙන තිබුණද එම ඒකකය 2013 මාර්තු 31 වන විටද ස්ථාපිත කර නොතිබුණි.

(ඉ) රත්මලාන සහ මොරටුව ප්‍රදේශවල ක්‍රියාත්මක අප ජලය බැහැර කිරීමේ ව්‍යාපෘතියක් විසින් කලපුවට සම්බන්ධිත ඇළ මාර්ග වලට අප ජලය මුදා හැරීම නිසා කලපුව ආශ්‍රිතව රොන්මඩ තැන්පත් වීමේ තත්ත්වයක් ඇති බව නිරීක්ෂණය වුවද එම තත්ත්වය නිවැරදි කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඊ) ව්‍යාපෘතිය, ජල සම්පාදන හා ජලාපවහන නව රේඛිය අමාත්‍යාංශයට පැවරීමෙන් අනතුරුව ව්‍යාපෘතියෙහි ප්‍රගති සමාලෝචනය කිරීම සඳහා ජාතික මෙහෙයුම් කමිටු රැස්වීම් පවත්වා නොමැති බව නිරීක්ෂණය විය.

(උ) රත්මලාන ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශය තුළ සමහර ඉඩම් කොටස්වල අයිතිය ඉඩම් අත්පත්කර ගැනීමේ පනතේ 38 (අ) වගන්තිය අනුව ආපසු පවරාදෙන ලෙස ව්‍යාපෘතිය විසින්, රේබිය අමාත්‍යාංශයෙන් ඉල්ලීම් කර ඇතත් අමාත්‍යාංශ අනුමැතිය ප්‍රමාද වීම හේතුවෙන් එම කාර්ය ඉටුවී නොතිබුණි.

## 3.6 අරමුදල් උපයෝජනය

සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතියේ අරමුදල් උපයෝජනය පහත දැක්වේ.

| | ණය ගිවිසුමට අනුව සැපයීමට එකඟ වූ ණය මුදල | | 2012 දෙසැම්බර් 31 දිනට අරමුදල් උපයෝජනය | අරමුදල් උපයෝජනය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | යෙන්(මිලි) | රු.(මිලි) | රු.(මිලි) | % |
| ජා.ස.ජ.බැ | 6,906 | 7,516 | 6,888 | 92 |
| ශ්‍රී.ලං.ර. | 2,157 | 2,348 | 2,471 | 100 |
| එකතුව | 9,063 | 9,864 | 9,359 | 94 |

ණය මුදල් විදේශ අරමුදල් කොටසේ සුදුසුකම්ලත් කාලය 2009 අප්‍රේල් මස අවසන් වූ අතර මුදල් ප්‍රතිපූරණය කිරීම සඳහා 2010 අප්‍රේල් දක්වා ඉඩදී තිබුණි.ණය මුදලෙන් සියයට 92 ක් උපයෝජනය වී ඇති අතර ඉතිරි කාර්යයන් ඒකාබද්ධ අරමුදල මගින් සිදුකර ඇත.

## 3.7 අරමුණු ඉටකර ගැනීම

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ව්‍යාපෘතිය මගින් සංවර්ධිත ඇළ මාර්ග හා කානු පද්ධතියට අදාළ රක්ෂිත සීමාවලින් බැහැරව පදිංචි වීම වෙනුවෙන් රු.5,876,825 ක් ලබාගෙන ඇති ඇතැම් ප්‍රදේශවාසීන් පිරිසක් නැවතත් එම රක්ෂිත සීමාවන් තළ අනවසර ඉදිකිරීම් හෝ පදිංචි වීම් කර ඇති බව නිරීක්ෂණය විය.

(ආ) දෙහිවල ගල්කිස්ස හා මොරටුව මහනගර සභා වලට අදාළව පවතින මානව සම්පත් හිඟය හේතුවෙන් හා සිටින සේවකයන්ට යන්ත්‍ර ක්‍රියාත්මක කිරීමට පුහුණුවක් නොමැතිවීමද ව්‍යාපෘතියේ සංවර්ධිත ඇළ මාර්ග හා කාණු පද්ධතිය නිසි පරිදි නඩත්තු නොවීමට ඉවහල් වී ඇති බව නිරීක්ෂණය විය.

(ඇ) ඇළ මාර්ග ක්‍රමවත්ව නඩත්තු කිරීම සඳහා ඒ දෙපසින්ම නිදහස පිරිසුම් මාර්ග තිබිය යුතුය. කෙසේවෙතත් ඇළ මාර්ග දෙපස ඇති රජයේ ඉඩම්, ව්‍යාපෘතිය විසින් පවරාගෙන නොමැතිවීම හෝ ප්‍රමාණවත් ආරක්ෂාවක් නොසැපයීම හේතුවෙන් නීතිවිරෝධී හා අනවසර ඉදිකිරීම් ඇළ මාර්ග දෙපස ඉදි වන බවත් එම නීතිවිරෝධී හා අනවසර ඉදිකිරීම් හේතුවෙන් මීටර් 820 ක් දිග ඇළ මාර්ග නියමාකාරයෙන් නඩත්තු කිරීමට නොහැකි වී ඇති බවත් නිරීක්ෂණය විය.